**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල බවුසරය හා ට්‍රැක්ටර් අළුත්වැඩියාවන් වෙනුවෙන් ගෙවිය යුතු රු.1,417,800 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සභාවේ කාර්යාල භූමිය හා වෙළඳ සංකීර්ණය වටා කුට්ටි ගල් ඇතිරීම සඳහා වැයකර තිබුණු රු.1,297,152 ක් ප්‍රාග්ධනගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනගත කරන ලද රු.371,791 ක්වූ පුස්තකාල පොත්, පරිත්‍යාග ලැබීම් මූල්‍යාධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු.105,846 ක් වූ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම් ගතකර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්
**---------------------------**

ගිණුම් විෂයයන් 04 ක උපයෝගී ලේඛන සහ මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂයන් අතර වෙනස්කම්වල එකතුව රු.4,741,122 ක් විය.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

(අ) **ලැබිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 12 ක ශේෂ එකතුව රු.71,813,947 ක් වූ අතර, එයින් වර්ෂ 05 කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු. 33,264,942 ක් විය.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 03 ක ශේෂ එකතුව රු.37,691,245 ක් වූ අතර එයින් වර්ෂ 05 ඉක්මවූ ණයහිමියෝ රු.6,031,855 ක් විය.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.231,592,590 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති , රීති , රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති , රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | |
| (i) 129(2) (අ)(ඊ) වගන්ති | 32,379,359 | ලැබිය යුතු බදු කුලී, බලපත්‍ර ගාස්තු, උසාවි දඩ, මුද්දර ගාස්තු, අත්තිකාරම් හා වැටුප් ප්‍රතිපූර්ණ විධිමත් පරිදි අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ii) 158 වගන්තිය | - | වරිපනම් හා අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා බදු ගෙවිය යුතු අයගේ චංචල හා නිශ්චල දේපල තහනමට ගෙන හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 159( I ) වගන්තිය | 5,348,059 | සභා දේපල කුලියට දීම මත අයවිය යුතු හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති**

| | | | |
|---|---|---|---|
| (i) | අංක 2 ( I ) (ඇ ) හා අංක 3 රීතින් | - | සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | අංක 66 රීතිය | - | ප්‍රාදේශීය සභා පනතේ 150 (4) අනුව ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (iii) | අංක 69 රීතිය | - | ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියේ විධිවිධානවලට අනුව ඉඩම් විකිණීම සඳහා පි.එස්.26 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iv) | . අංක 81 රීතිය | - | මුද්දර ගාස්තු සභාව වෙත ලබා ගැනීම සඳහා එක් එක් කාර්තුව අවසානයේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | අංක 218 රීතිය | - | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. |

## 2 . මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,499,271 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,446,633ක් විය.

#### 2.1.1 මූල්‍ය පාලනය

වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව පවතින රු.42,055 ක ශේෂයක් තිබෙන බැංකු ජංගම ගිණුම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ‘000 | රු. ‘000 | රු. ‘000 | රු. ‘000 | රු. ‘000 | රු ‘.000 | රු. ‘000 | රු. ‘000 |
| (i) | වරිපනම් හා බදු | 4,733 | 3,449 | 5,152 | 2,059 | 1,380 | 1,329 | 1,493 | 3,790 |
| (ii) | කුලී | 14,050 | 9,115 | 8,261 | 1,106 | 8,400 | 6,705 | 7,200 | 4,497 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,500 | 1,278 | 1,278 | - | 5,005 | 3,221 | 3,221 | - |
| (iv) | වෙනත් ආදායම් | 23,560 | 1,684 | 1,684 | - | 29,130 | 873 | 873 | - |

සටහන: රැස්කළ ආදායම තුල වර්ෂයේ බිල්කල ආදායමෙන් රැස්කල ආදායම සහ හිඟහිටි ආදායමෙන් රැස්කළ ආදායම ඇතුළත් වේ.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

වර්ෂයේ බිල්කිරීම් සමඟ ඉකුත් වර්ෂවල හිඟ ආදායම්වලින් වරිපනම් හා බදු සහ කුලී පිළිවෙලින් සියයට 71 ක් සහ සියයට 61 ක් වශයෙන් අයවිය යුතුව තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) වරිපනම්**

සමාලෝචිත වර්ෂයේදී හිඟ වරිපනම් එකතුකිරීමේ වැඩසටහනක් පවත්වා සභා තීරණයක් මත නිලධාරීන් වෙත රු.115,443 ක කොමිස් මුදල් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,609,707 ක් වූ අතර, ඉන් වර්ෂ 05 ට වැඩි ශේෂය රු.816,009 ක් විය.

**(ආ) අක්කර බදු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.449,851 ක අක්කර බදු හිඟයක් වූ අතර, එයින් රු.100,862 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පවතින ශේෂ විය. වර්ෂ 5 කට වරක් බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදුකර අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීම හා අක්කර බදු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 කුලී**

ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.1,095,094 ක් විය. එයින් වර්ෂ 05 කට වැඩි ශේෂ රු.87,318 ක් හා වර්ෂ 01 - 05 අතර ශේෂ රු .25,833 ක් විය. හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාව සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.8,676,109 ක් හා මුද්දර ගාස්තු රු.15,892,495 ක් විය.

**3 . මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාරණා 52 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණු අතර පාරවල්, මහජන සෞඛ්‍ය හා

සුඛ විහරණ ක්‍රම සහ ජල සම්පාදනය හා ජල කර්මාන්ත යන සේවාවන් සැපයීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

---------------------------

පිළියෙල කර තිබූ වාර්ෂික සංවර්ධන සැළැස්ම අනුව වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා ළමා දන්ත හා සෞඛ්‍ය සායන පැවැත්වීම, පාසැල් නොයන හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට අධ්‍යාපනය ලබාදීම, ගෙවතු වගා වැඩසටහන්, නගර හා පරිසර අලංකරණය, කියවීම් ශාලා හා ජංගම පුස්තකාල සේවා ක්‍රියාත්මක කිරීම, මාර්ග ගැසට් කිරීම, වැව් තාවුළු රක්ෂණය, හෝටල් ශ්‍රේණිගත කිරීම සහ අහයභූමි පවරාගැනීම ඉටුකළ නොහැකි වී තිබුණි.

(ඇ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

----------------------------------------------

ක්‍රියාකාරී සැළැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 11 ක් ඉටු කිරීම සඳහා රු.940,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද, රු.820,000 ක් වූ ඇස්තමේන්තුගත කර්තව්‍යයන් 10 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර, රු.120,000 ඇස්තමේන්තුවෙන් රු.5,250 ක් පමණක් වැයකර වැඩසටහන් එකක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) අත්හැර දැමූ කර්තව්‍යයන්

--------------------------------

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත විවිධ ව්‍යාපෘති යටතේ වූ කර්මාන්ත 42 කින් කර්මාන්ත 04 ක් නිමකර නොතිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් කොම්පෝස්ට් ව්‍යාපෘතිය වෙනුවෙන් රු.200,000 ක් හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාදීම වෙනුවෙන් රු. 100,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණද එම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

(ii) කසළ බඳුන් හා කාබනික පොහොර බඳුන් ලබාදීම වෙනුවෙන් රු.80,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණද එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී සිටියද ඒ සම්බන්ධයෙන් එක් මඟ පෙන්වීමක් සිදු කර තිබුණි.

(ii) මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ජුලි 25 දිනැති අංක 2/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 6.1 ඡේදය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති හරහා දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහන් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව පුද්ගලයින් හා ආයතන 12 කින් ලැබිය යුතු රු.581,272 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගන්නා ලෙස පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව 2016 ඔක්තෝබර් 13 දින නියෝග කර තිබුණද, එම නියෝගය 2018 අප්‍රේල් වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සභාවට අයත් පැරණි කඩ කාමර 60 කින් රු.1,095,094 ක හිඟ කුලියක් අයවීමට තිබූ අතර ඊට අදාල කුලී ගිවිසුම් හා ලිපිගොනු අස්ථානගත වී තිබුණි. තවද එම කඩ කාමර වලින් කඩ කාමර 03 ක් සඳහා රු.77,491 කඩකුලී හිඟව තිබුණු අතර වර්ෂ 04 සිට 05 දක්වා කාලයක සිට කඩකුලී බිල් කර නොතිබුණි.

(ඇ) මදුරන්කුලිය තොඩුවාව පාරේ පිහිටි කඩ කාමරයක් බදුකරු කුලී ගෙවීම පැහැර හරිමින් කඩ කාමරයේ අයිතිය බදුකරු සතු කර ගැනීමට පුත්තලම දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවට සභාව ඉදිරිපත් වී නොතිබීම හේතුවෙන් බදුකරුට පක්ෂව ලැබූ තීන්දුවට එරෙහිව කරුණු ඉදිරිපත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 68 ක් වුවත් 2018 මාර්තු 28 දින වනවිට 111 දෙනෙකු සේවයේ නිරත වී සිටින අතර එයින් 29 දෙනෙක් අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ස්ථිර තත්ත්වය ප්‍රදානය කර ඇති සේවකයින් විය. සේවා ගිවිසුම් මත 18 දෙනෙක් බඳවා ගෙන තිබුණු අතර ද්වීතියික තනතුරු 01 ක් හා ප්‍රාථමික තනතුරු 08 ක් පුරප්පාඩු වී තිබුණි. අනියම් /ආදේශක තනතුරු 21 ක් අනුමත කාර්යය මණ්ඩලයෙන් බැහැරව බඳවා ගෙන තිබුණි.

(ආ) පසුගිය වර්ෂවලදී සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාමගිය සහ වැඩතහනම් සේවකයින් 20 දෙනෙකුගෙන් රු. 359,013 ක ණය ශේෂයක් අයවිය යුතුව තිබුණි.

**3.4. වත්කම් කළමනාකරණය**

**3.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.165,500 ක් වටිනා ජල බවුසර් 2 ක් භාවිතයෙන් තොරව ප්‍රධාන කාර්යාල භූමියේ ගාල් කර තිබුණි.

(ආ) 2008 වර්ෂයට පෙර මිලදී ගෙන තිබූ රු: 540,361 ක් වටිනා යන්ත්‍රෝපකරණ තොගයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.5** **හඳුනාගත් පාඩු**

2017 සැප්තැම්බර් 07 දින සිදුකළ භෞතික නියැදි විගණන පරික්ෂණවලදී වාහන අමතර කොටස්වල රු.95,680 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

**3.6** **ප්‍රසම්පාදනය**

**3.6.1** **ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය අනුව පිළියෙල කළ යුතු වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම සභාව විසින් වර්ෂ ගණනාවක සිට පිළියෙල කර නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැයගත වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන ඉක්මවා රු.698,702 ක වියදම් දරා තිබිණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වෙසෙන මහජනතාවගේ සුභසාධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අයවැයගත වැය විෂයය 56 ක් යටතේ වෙන්කර තිබුණු රු. 5,070,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් ඉතිරි වී හෝ වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබු අතර ඊට අදාල සේවාවන් කිසිවක් ඉටුකර නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා රු.81,300,000 ක් වෙන්කර තිබුණද, රු.57,709,553 ක් ඉතිරිව තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 71 ක ප්‍රමාණයක් විය.

**4.2** **අභ්‍යන්තර විගණනය**

මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් | |
| | (i). ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණය සිදු නොකිරීම. |
| | (ii). පරිගණක උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) අයවැය පාලනය | (i) | මහජන සුහසාධන කටයුතු ඉටු කර නොතිබීම. |
| | (ii) | ප්‍රතිපාදන විශාල ලෙස ඉතිරිවී තිබීම. |
| (ඇ) අභ්‍යන්තර විගණනය | | අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර නොතිබීම. |
| (ඇ) ණය ගැති පාලනය | | පැරණි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඉ) සේවක කළමනාකරණය | (i) | පූරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| | (ii) | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |